# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 12,784 — 1961 නොවැම්බර් 27 වැනි සඳුද — 27.11.1961**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)**


# I වැනි කොටස: (I) වැනි ඡේදය–සාමාන්‍ය

## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම්

**1961 අංක 479**

අ. ආ. කා. අංකය : සී. 244/60 (II)

ප්‍රවාහණ හා රජයේ වැඩ පිළිබඳ ඇමති, පාර්ලිමේන්තු මන්ත්‍රී, ගරු ඉඩම්පිටිය රාල්ලාගේ පුංචි බණ්ඩා ගුණතිලක කලුගල්ල මහතා දිවයිනට පෙරළා පැමිණෙනතුරු, අග්‍රාණ්ඩුකාරතුමන් විසින්, 1946යේ හා 1947තේ ලංකා (ආණ්ඩුක්‍රම හා ස්වාධීනතා) රාජාඥවල 49 වැනි වගන්තිය යටතේ ප්‍රවාහණ හා රජයේ වැඩ පිළිබඳ ගරු ඇමතිතුමාගේ පාර්ලිමේන්තු ලේකම්, පාර්ලිමේන්තු මන්ත්‍රී, ටිකිරි බණ්ඩා තෙන්නකෝන් මහතා, 1961 නොවැම්බර් 25 වැනි දින සිට, ප්‍රවාහණ හා රජයේ වැඩ පිළිබඳ ඇමති වශයෙන් වැඩ බැලීමට පත් කළ බව, මෙයින් දනුම් දෙනු ලැබේ.

උතුමාණන්වහන්සේගේ අණ පරිදි,

ඇන්. ඩබ්ලිව්. අතුකෝරාළ,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

1961 නොවැම්බර් 25 වැනි දින,
කොළඹ, අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්යාලයේදී ය.

11–139

---

## මිළ පාලන දන්වීම්

**ඇම්.ඇල්. 1961/15 වෙනි අංකය දරණ ආහාර මිළ නියෝගය**

**අතිරේක ආහාර ද්‍රව්‍ය (උම්බලකඩ හෝ බොනිටෝ්පිෂ්)**
**එකතු කළ යුතු නිත්‍ය මිළක් නියම කිරීම**

**1950 අංක 29 දරණ මිළ පාලන පනත**

**නියෝගය**

මාතලේ පාලන දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක තැන්පත් ගාර්ඩියේ පුංචිහේවාගේ බුද්ධදස ද සිල්වා වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 3 (2) දරණ වගන්තිය සමග කියවිය යුතු 4 වෙනි වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල අනුව :—

(1) 1950 අංක 29 දරණ මිළ පාලන පනත යටතේ සකස්ව කොළඹ නාගරිකයේ දනට බලපවත්නා තොග වෙළෙන්දෙකු විසින් දළබර හොණ්ඩරයක් විකිණිය හැකි වැඩිම තොග මිළ ගණනට මීට යාකර ඇති දෙවෙනි උපලේඛනයේ 3 වෙනි තීරයේ සඳහන් ගණන් එකතු කිරීමෙන් ගැණෙන මිළ ගණන් තොග වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් විකිණීමේදී 2 උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් උම්බලකඩ හෝ බොනිටෝ්පිෂ් දළබර හොණ්ඩරයක් විකිණිය හැකි වැඩිම මිළ ගණන් ලෙසද, ඉහත සඳහන් මිළ පාලන පනත යටතේ සකස්ව කොළඹ නාගරිකයේ දනට බලපවත්නා සිල්ලර වෙළෙන්දෙකු විසින් ශුද්ධ බර රාත්තලක් විකිණිය හැකි වැඩිම සිල්ලර මිළ ගණනට මෙයට යාකර ඇති 2 උපලේඛනයේ 4 වෙනි තීරයේ සඳහන් ගණන් එකතු කිරීමෙන් ගැණෙන මිළ ගණන් සිල්ලර වෙළෙන්දෙකු විසින් සිල්ලර වශයෙන් පාරිභෝගියෙකුට විකිණීමේදී 2 උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් උම්බලකඩ හෝ බොනිටෝ්පිෂ් ශුද්ධ බර රාත්තලක් විකිණිය හැකි වැඩිම මිළ ගණන් ලෙසද, මේ දන් පටන් නියම කරන අතරම, මේ මිළ ගණන්වලට වැඩියෙන් 2 වෙනි උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් උම්බලකඩ හෝ බොනිටෝ්පිෂ් එම උපලේඛනයේ 2 වෙනි තීරයේ අනුපිළිවෙළින් පෙන්වා ඇති, 1 වෙනි උපලේඛනයේ සවිස්තරව විග්‍රහකොට ඇති, මාතලේ පාලන දිස්ත්‍රික්ක සීමාවන් තුළ නොවිකිණිය යුතු බවද, නියම කරමි.

(2) තවද, මෙම නියෝගයේ කාර්ය සඳහා—

(අ) 2 වෙනි උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම හෝ එම උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් වරකට දළබර හොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණය බැගින් කොයි අන්දමට විකිණීම හෝ තොග වශයෙන් විකිණීමක් ලෙස සළකනු ලබන බවත්;

(ආ) 2 වෙනි උපලේඛනයේ සඳහන් උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් පාරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස හෝ දළබර හොණ්ඩරයකට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සළකනු ලබන බවත් ;

මෙම නියෝගයෙන් නියම කරමි.

(3) එසේම, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම 2 වෙනි උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් වෙන ද්‍රව්‍යයක් සමග මිශ්‍ර කිරීමෙන් බාල කොට කිසිවෙකු විසින් නොවිකිණිය යුතු බවද නියම කරමි.

(4) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම යම් ස්ථානයක හෝ වාහනයක, 2 වෙනි උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් සිය ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ හෝ තබාගෙන සිටින සෑම වෙළෙන් දෙකුම එම ද්‍රව්‍යයෙන් සුදුසු ප්‍රමාණයක් සුදුසු භාජනයක දමා, එම ද්‍රව්‍ය සඳහා මේ නියෝගයෙන් වැඩිම මිළ උසින් අඟලකට වඩා අඩු නොවූ ඉලක්කම්වලින් මිළ පුවරුවක සටහන් කොට එම භාජනයට සම්බන්ධකොට එකී උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් හා නියමිත වැඩිම මිළ ඕනෑම ගණුදෙනු කාරයෙකුට පැහැදිළිව පෙනෙනසේ එකී ස්ථානයේ හෝ වාහනයේ තැබිය යුතු බවද නියම කරමි.

(5) එසේම, මෙම නියෝගයේ කාර්යය සඳහා "රාත්තල" හෙවත් "රා" යන්නෙන් සළකනු ලබන්නේ ඇවර්දුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

(6) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම, 2 වෙනි උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් තොග වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු හෝ එම උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු විසින්ම මිළයට ගන්නා ඉල්ලුවහොත්, පහත සඳහන් විස්තර, එනම් :—

(අ) විකුණූ දිනය ;

(ආ) එම ද්‍රව්‍යයෙන් විකුණූ ප්‍රමාණය, (බර අනුවයි);

(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල;

(ඈ) වෙළඳාමේ ස්වභාවය, එනම්, වෙළඳාම තොග වශයෙන්ද, සිල්ලර වශයෙන්ද,

යන වග ඇතුළත් කුවිතාන්සියක් මිළයට ගන්නාට දිය යුතු බවද නියම කරමි.

(7) 2 වෙනි උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් විකුණන විට ඒ විකුණනු ලබන උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් යම්කිසි දෙයක ඔතනු ලැබේ නම්, නැතහොත් බහාලනු ලැබේනම්, එහි මිළත් එම උපලේඛනයේ 3 සහ 4 යන තීරවල සඳහන් මිළ ගණන්වලට ඇතුළත් වන බවද නියම කරමි.

1961 නොවැම්බර් මස 21 වෙනි දින පෙරවරු 9.30 ට මාතලේදී අත්සන් කරන ලදී.

ජී. පී. බී. ද සිල්වා,
මාතලේ පාලන දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක.

## 1 වෙනි උපලේඛනය

අංක 1 දරණ කොට්ඨාශය :—

කුඹියන්ගොඩ හැර මාතලේ පලාත් පාලන සභා කොට්ඨාශය.

අංක 2 දරණ කොට්ඨාශය :—

(අ) මාතලේ පලාත් පාලන සභා කොට්ඨාශය, ඕව්ලිකන්ද, පරනගන්තැන්න, වැහිගල හැර මාතලේ දකුණු ප්‍රාදේශීය ආදයම් නිලධාරි තැනගේ කොට්ඨාශය.

(ආ) පොල්වත්තේකන්ද සහ වෙලන්ගහවත්ත හැර මාතලේ නැගෙනහිර ප්‍රාදේශීය ආදයම් නිලධාරිතැනගේ කොට්ඨාශයට අයත් මාතලේ පල්ලේසිය පත්තුව.

(ඉ) මාතලේ පලාත් පාලන සභා කොට්ඨාශයට අයත් කුඹියන්ගොඩ.

අංක 3 දරණ කොට්ඨාශය :—

(අ) මාතලේ උතුරු ප්‍රාදේශීය ආදයම් නිලධාරිතැනගේ කොට්ඨාශය.

(ආ) මාතලේ නැගෙනහිර ප්‍රාදේශීය ආදයම් නිලධාරිතැනගේ කොට්ඨාශයේ ගහල පල්ලේසිය පත්තුව සහ අඹන්ගඟ කෝරලය.

(ඉ) මාතලේ දකුණු ප්‍රාදේශීය ආදයම් නිලධාරිතැනගේ කොට්ඨාශයේ පරනගන්තැන්න, වැහිගල, ඕව්ලිකන්ද සහ මාතලේ නැගෙනහිර ප්‍රාදේශීය ආදයම් නිලධාරි තැනගේ කොට්ඨාශයේ පොල්වත්තේකන්ද සහ වෙලන්ගහවත්ත.

අංක 4 දරණ කොට්ඨාශය :—

මාතලේ නැගෙනහිර ප්‍රාදේශීය ආදයම් නිලධාරිතැනගේ කොට්ඨාශයේ ගහල උඩසිය පත්තුව, ලග්ගල උඩසිය පත්තුව සහ ලග්ගල පල්ලේසිය පත්තුව.

## 2 වෙනි උපලේඛනය

| 1 වෙනි තීරය විස්තරය | 2 වෙනි තීරය කොට්ඨාශය | 3 වෙනි තීරය තොග වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් විකිණීමේදී දළ බර හොණ්ඩරයක් කොළඹ නාගරිකයේ මිළට වඩා වැඩියෙන් විකිණිය හැකි වැඩිම මිළ | 4 වෙනි තීරය සිල්ලර වෙළෙන්දෙකු විසින් සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක් කොළඹ නාගරිකයේ මිළට වඩා වැඩියෙන් විකිණිය හැකි වැඩිම මිළ |
|---|---|---|---|
| | | රු. ශ. | රු. ශ. |
| උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් ... ... ... ... | 1 ... | 4 55 ... | 0 04 |
| | 2 ... | 4 95 ... | 0 05 |
| | 3 ... | 5 35 ... | 0 06 |
| | 4 ... | 5 95 ... | 0 07 |

සැළකිය යුතුයි.—මේ මිළ ගණන් ඉහත සඳහන් උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් විකිණීමේ නියමිත මිළ නොවේ. මේවා උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් විකිණිය හැකි ඉතාම වැඩි මිළ ගණන්ය. මේ මිළ ගණන්වලට ඉහළින් උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් විකිණිය නොහැකිය.

11-58

---

## 1950 අංක 29 දරණ මිළ පාලන පණත

අංක : ඇම්. ටී. 18/61

අතිරේක ආහාර ද්‍රව්‍ය
(උම්බලකඩ හෝ බොනිටෝෆිෂ්)

### නියෝගය

මාතර දිස්ත්‍රික්කයේ සහකාර ආහාර මිළ පාලක තැන්පත් හෙට්ටිගේ දෙන් වියුඩර් බෝදිදස වන මම, 1950 අංක 29 දරන මිළ පාලන පණතේ 4 වන වගන්තියෙන් හා 3 (2) යන වගන්තියෙන් ද මා කෙරෙහි පැවරී ඇති බලතල අනුව—

(1) 1950 අංක 29 දරණ ආහාර මිළ පාලන පණත යටතේ සකස් වූ කොළඹ නාගරිකයේ තොග වෙළෙන්දකු විසින් දැනට විකිණිය හැකි උපරිම තොග මිළ ගණනට, මෙයට යාකර ඇති උපලේඛනයේ 2 කේ සිට 7 වැනි තීරයන්හි සඳහන් ගණන් එකතු කිරීමෙන් එම උපලේඛනය 1 වෙනි තීරයේ විස්තර කරන ලද ද්‍රව්‍ය දළබර හොණ්ඩරයක් අනුපිළිවෙලින් උපලේඛනයේ 2 සිට 7 වෙනි තීරයන් සඳහන් ප්‍රදේශවල තොග වශයෙන් මේ මොහොතේ සිට විකිණිය හැකි වැඩිම මිළ ගණන් බව මෙයින් නියෝග කරමි.

(2) 1950 අංක 29 දරණ ආහාර මිළ පාලන පණත යටතේ සකස් වූ කොළඹ නාගරිකයේ සිල්ලර වෙළෙන්දකු විසින් දැනට විකිණිය හැකි උපරිම සිල්ලර මිළ ගණනට, මෙයට යාකර ඇති උපලේඛනයේ 8 වැනි තීරයෙහි සඳහන් ගණන් එකතු කිරීමෙන් එම උපලේඛනයේ 1 වෙනි තීරයෙහි විස්තර කරන ලද ද්‍රව්‍යය සිල්ලර රාත්තලක් මාතර පරිපාලන දිස්ත්‍රික්කයේ සිල්ලර වශයෙන් මේ මොහොතේ සිට විකිණිය හැකි වැඩිම මිළ ගණන් බව මෙයින් නියෝග කරමි.

(3) තවද මෙම නියෝගයේ කාර්ය සඳහා—

(අ) උපලේඛනයේ 1 වන තීරයේ සඳහන් ද්‍රව්‍යයන් ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ එම උපලේඛනයේ 1 වන තීරයේ සඳහන් කිසිම ද්‍රව්‍යයක් වරකට දලබර හොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් බැගින් කොයි අන්දමට විකිණීම හෝ තොග වශයෙන් විකිණීමක් ලෙස සලකන බවත් ;

(ආ) උපලේඛනයේ 1 වන තීරයේ සඳහන් ද්‍රව්‍යයන් පාරිභෝගය පිණිස දළබර හොණ්ඩරයකට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත් ;

මෙම නියෝගයෙන් නියම කරමි.

(4) එසේම මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම උපලේඛනයේ 1 වන තීරයෙහි සඳහන් කිසිම ද්‍රව්‍යයක් වෙන ද්‍රව්‍යයක් සමග මිශ්‍ර කිරීමෙන් බාලකොට කිසිවෙකු විසින් නොවිකිණිය යුතු බව නියම කරමි.

(5) තවද මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම යම් ස්ථානයක හෝ යම් වාහනයක උපලේඛනයේ 1 වන තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් සිය ස්වාමිත්වය හෝ පාලනය යටතේ හෝ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකුම එවැනි ද්‍රව්‍යයකින් ප්‍රමාණයක් සුදුසු භාජනයක දමා එම ද්‍රව්‍ය සඳහා මේ නියෝගයෙන් වැඩිම මිළ උසින් අඟලකට වඩා අඩු නොවූ ඉලක්කම් වලින් මිළ පුවරුවක සටහන් කොට එම භාජනයට සම්බන්ධ කොට එකී ද්‍රව්‍ය හා නියමිත වැඩිම මිළ ඕනෑම ගනුදෙනුකාරයෙකුට පැහැදිලිව පෙනෙන සේ එකී ස්ථානයේ හෝ වාහනයේ තැබිය යුතු බව නියම කරමි.

(6) එසේම මෙම නියෝගයේ කාර්ය සඳහා " රාත්තල " හෙවත් " රා " යන්නෙන් සළකනු ලබන්නේ ඇවර්දුපෝයි බ්රක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

(7) තවද මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම් කරනු ලැබූ සෑම ප්‍රදේශයකම් උප ලේඛනයේ 1 වන තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් තොග වශයෙන් විකුණන සෑම වෙළෙන්දෙකුම් හෝ එම උප ලේඛනයේ 1 වන තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් සිල්ලර වශයෙන් විකුණන සෑම වෙළෙන්දකු විසින් ම මිළයට ගන්නා ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර එනම් :—

(අ) විකුණූ දිනය ;
(ආ) එම ද්‍රව්‍යයන් විකුණූ ප්‍රමාණය (බර අනුව) ;
(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ;
(ඈ) වෙළඳාමේ ස්වභාවය, එනම් වෙළෙඳාම් තොග වශයෙන්ද සිල්ලර වශයෙන් ද යන වග ඇතුළත් කුවිතාන්සියක් මිළයට ගන්නාව දීය යුතු බව ද නියම කරමි.

(8) උපලේඛනයේ 1 වන තීරයෙහි සඳහන් යම් ද්‍රව්‍යයක් විකුණූ විට ඒ විකුණනු ලබන ද්‍රව්‍යය යම්කිසි දෙයක ඔතනු ලැබේ නම්, එහි මිළත් එම උපලේඛනයේ 2 කේ සිට 8 වන තීරයන්හි සඳහන් වැඩිම මිළ ගණන් වලට ඇතුළත් වන බවද නියම කරමි.

1961 නොවැම්බර් මස 21 වෙනි දින අ.භා. 4ට මාතරදී අත්සන් කරන ලදී.

එච්. ඩී. ටී. බෝදිදස,
මාතර දිස්ත්‍රික්කයේ සහකාර ආහාර මිළ පාලක තැන.

## උපලේඛනය

| 1 තීරය | 2 තීරය | 3 තීරය | 4 තීරය | 5 තීරය | 6 තීරය | 7 තීරය | 8 තීරය |
|---|---|---|---|---|---|---|---|
| | සීමාව | සීමාව | සීමාව | සීමාව | සීමාව | සීමාව | සීමාව |
| වර්ගය | මාතර නගර සභාව, දෙවිනුවර සුළු නගර දෙවිනුවර ගම්කාර්ය සභාව, කැකනදුර ගම් කාර්ය සභාව, මාලිම්බඩගම්—කාර්ය සභාව, නාඩිමන—මකාවිටගම්කාර්ය සභාව මඩිහ ගොඩගම ගම් කාර්යසභාව හා මොලොද්දුව ගම්කාර්ය සභාව | වැලිගම නගර සභාව වැලිගම ගම් කාර්යසභාව | අකුරැස්ස ගම් කාර්ය සභාව ගොඩපිටිය ගම්කාර්ය සභාව | හක්මන ගම් කාර්ය සභාව, කඹුරුපිටිය ගම්කාර්ය සභාව, කන්දපිට වලකඩ ගම්කාර්ය සභාව, දික්වැල්ල ගම්කාර්ය සභාව | මොරවක ගම්කාර්ය සභාව | බෙරලපනාතර ගම්කාර්ය සභාව, දෙනියායගම්කාර්ය සභාව | සිල්ලර වෙළෙන්දකු විසින් ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් මාතර පරිපාලන දිස්ත්‍රික්කය ඇතුළත කොළඹ නගරයට වඩා වැඩියෙන් විකිණියහැකි වැඩිම මිළ |
| තොග වෙළෙන්දකු විසින් දළබර හොණ්ඩරයක් තොග වශයෙන් කොළඹ නගරයට වඩා වැඩියෙන් විකිණිය හැකි වැඩිම මිළ | | | | | | | |
| | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| උම්බලකඩ හෝ බොනිටෝ fපිෂ් ... | 3 10 ... | 3 0 ... | 3 0 ... | 3 20 ... | 3 30 ... | 3 40 ... | 0 3 |

**සැළකිය යුතුයි.**—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණිය හැකි නියමිත මිළ නොවේ. මේවා ඒ ඒ ද්‍රව්‍ය විකිණිය හැකි ඉතාම වැඩි මිළ ගණන්ය. එම මිළ ගණන්වලට ඉහලින් ඒ ද්‍රව්‍යයන් විකිණිය නොහැකිය.

11–134

---

**පී. ඇල්. 15/61 වෙනි අංකය දරණ ආහාර මිළ නියෝගය** **අතිරේක ආහාර ද්‍රව්‍ය (උම්බලකඩ හෝ බොනිටෝ පිෂ්)**

## 1950 අංක 29 දරණ මිළ පාලන පනත

### නියෝගය

පොළොන්නරුව පාලන දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක තැන්පත් චාර්ල්ස් අබේදීර වන මම, 1950 අංක 29 දරණ මිළ පාළන පනතෙහි 3 (2) දරණ වගන්තිය සමග කියවිය යුතු 4 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව—

(1) 1950 අංක 29 දරණ මිළ පාළන පනත අනුව සකස්වුනු මීට යාකොට ඇති පළමුවැනි උපලේඛනයේ 2 වැනි තීරයේ සඳහන් ද්‍රව්‍ය කොළඹ නාගරිකයේ තොග වෙළෙන්දෙකුට තොග වශයෙන් විකිණීමේදී දළ බර හොණ්ඩරයක් විකිණිය හැකි වැඩිම තොග මිළට, මීට යාකොට ඇති පළමුවැනි උපලේඛනයේ 3 වැනි තීරයේ සඳහන් මිළ ගණන් එකතු කිරීමෙන් එම උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ප්‍රදේශය තුළ එම උපලේඛනයේ 2 වැනි තීරයේ සඳහන් ආහාර ද්‍රව්‍ය විකිණිය හැකි වැඩිම මිළ ගණන් මේ දුන් පටන් සකස් කරගත යුතු බැව් මෙම නියෝගයෙන් නියම කරමි.

(2) 1950 අංක 29 දරණ මිළ පාලන පනත අනුව සකස් වුනු මීට යාකොට ඇති දෙවැනි උපලේඛනයේ 2 වැනි තීරයේ සඳහන් ද්‍රව්‍ය කොළඹ නාගරිකයේ සිල්ලර වෙළෙන්දෙකුට සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක් විකිණිය හැකි වැඩිම සිල්ලර මිළට, මීට යාකොට ඇති දෙවැනි උපලේඛනයේ 3 වැනි තීරයේ සඳහන් මිළ ගණන් එකතු කිරීමෙන් එම උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ප්‍රදේශ තුළ එම උපලේඛනයේ 2 වැනි තීරයේ සඳහන් ආහාර ද්‍රව්‍ය විකිණිය හැකි වැඩිම මිළ ගණන් මේ දුන් පටන් සකස් කර ගත යුතු බැව් මෙම නියෝගයෙන් නියම කරමි.

(3) තවද, මෙම නියෝගයෙහි කාර්ය සඳහා—

(අ) මීට යාකර ඇති පළමුවැනි උපලේඛනයේ 2 වැනි තීරයේ සහ දෙවැනි උපලේඛනයේ 2 වැනි තීරයේ සඳහන් ඕනෑම ද්‍රව්‍යයකින් ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ වරකට දළ බර හොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් කොයි අන්දමට විකිණීම හෝ තොග වශයෙන් විකිණීමක් ලෙස සළකනු ලබන බවත් මෙම නියෝගයෙන් නියම කරමි.

(ආ) මීට යාකර ඇති පළමුවැනි උපලේඛනයේ 2 වැනි තීරයේ හා දෙවැනි උපලේඛනයේ 2 වැනි තීරයේ සඳහන් ඕනෑම ද්‍රව්‍යයකින් පාරිභෝගය හෝ පාවිච්චිය පිණිස වරකට දළ බර හොණ්ඩරයකට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත් මෙම නියෝගයෙන් නියම කරමි.

(ඇ) මීට යාකර ඇති පළමුවැනි උපලේඛනයේ 2 වැනි තීරයේ හා දෙවැනි උපලේඛනයේ 2 වැනි තීරයේ සඳහන් ඕනෑම ද්‍රව්‍යයකින් තොග වශයෙන් විකුණන දළ බර හොණ්ඩරයකට අඩු හෝ වැඩි ඕනෑම ප්‍රමාණයකට ගෙවිය යුතු වැඩිම මුදල ගණන් ගනු ලබන්නේ මෙහි සඳහන් දළ බර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණීමේ වැඩිම මිළ ගණන් අනුව බවත් මෙම නියෝගයෙන් නියම කරමි.

(4) එසේම මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම පළමුවැනි උප‍ෙ‍ ඛනයේ 2 වැනි තීරයේ හා දෙවැනි උපලේඛනයේ 2 වැනි තීරයේ සඳහන් කිසිම ද්‍රව්‍යයක් වෙන ද්‍රව්‍යයක් සමග මිශ්‍ර කිරීමෙන් බාල කොට නොවිකිණිය යුතු බැව් මෙම නියෝගයෙන් නියම කරමි.

(5) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම යම් ස්ථානයක හෝ වාහනයක පළමුවැනි උපලේඛනයේ 2 වැනි තීරයේ හා දෙවැනි උපලේඛනයේ 2 වැනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් සිය ස්වාමිත්වය හෝ පාලනය යටතේ තබා ගෙන සිටින සෑම වෙළෙන්දෙකුම එවැනි ද්‍රව්‍යයකින් සුදුසු ප්‍රමාණයක් යම් භාජනයක දමා එම ද්‍රව්‍ය සඳහා මෙම නියෝගයෙන් නියම කරන ලද වැඩිම මිළ උසින් අඟලකට අඩු නොවූ ඉලක්කම් වලින් මිළ පුවරුවක සටහන් කොට එම මිළ පුවරුව එම භාජනයට ඇඳා එකී ද්‍රව්‍යය හා නියමිත මිළ ඕනෑම ගනුදෙනුකාරයෙකුට පැහැදිළිව පෙනෙන සේ එකී ස්ථානයේ හෝ වාහනයේ තැබිය යුතු බව මෙම නියෝගයෙන් නියම කරමි.

(6) එසේම, මෙම නියෝගයෙහි කාර්ය සඳහා " රාත්තල " හෙවත් " රා " යන්නෙන් සළකනු ලබන්නේ ඇවර්දුපෝයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද මෙම නියෝගයෙන් නියම කරමි.

(7) මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම මීට යාකර ඇති පළමුවැනි උපලේඛනයේ 2 වැනි තීරයේ හා දෙවැනි උපලේඛනයේ 2 වැනි තීරයේ සඳහන් ද්‍රව්‍ය තොග වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු හා මීට යාකර ඇති පළමුවැනි උපලේඛනයේ 2 වැනි තීරයේ හා දෙවැනි උපලේඛනයේ 2 වැනි තීරයේ සඳහන් ද්‍රව්‍ය සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු විසින්ම මිළයට ගන්නා ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර, එනම් :—

(අ) විකුණූ දිනය ;

(ආ) එම ද්‍රව්‍යයෙන් විකුණූ ප්‍රමාණය (බර අනුවයි) ;

(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ;

(ඈ) වෙළඳාමේ ස්වභාවය, එනම්, වෙළඳාම තොග වශයෙන්ද නැතහොත් සිල්ලර වශයෙන්ද යන වග ඇතුළත් කුවිතාන්සියක් දිය යුතු බවද මෙම නියෝගයෙන් නියම කරමි.

(8) මීට යාකර ඇති පළමුවැනි උපලේඛනයේ 2 වැනි තීරයේ හා දෙවැනි උපලේඛනයේ 2 වැනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් විකුණන විට ඒ විකුණන ලද ද්‍රව්‍ය යම්කිසි දෙයක ඔතනු ලැබුයේ නම් හෝ බහා ලනු ලැබුයේ නම් එහි මිළත් පළමුවැනි උපලේඛනයේ 3 වැනි තීරයේ හා දෙවැනි උපලේඛනයේ 3 වැනි තීරයේ සඳහන් මිළ ගණන් වලට ඇතුළත්වී ඇති බවද මෙම නියෝගයෙන් නියම කරමි.

1961 නොවැම්බර් මස 22 වැනි දින පෙරවරු 10 ට පොළොන්නරුවේ දිසාපති කායාීලයේදී අත්සන් තබන ලදී.

සී. අබේදීර,
පොළොන්නරුව දිස්ත්‍රික්කයේ
සහකාර මිළ (ආහාර) පාළක තැන.

## පළමුවැනි උපලේඛනය

| 1 වැනි තීරය<br>ප්‍රදේශය | 2 වැනි තීරය<br>විස්තර | 3 වැනි තීරය<br>කොළඹ නාගරිකයේ තොග වෙළෙන්දෙකු විසින් දළ බර හොණ්ඩරයක් තොග වශයෙන් විකුණන මිළට එකතු කළ යුතු වැඩිම මිළ<br>රු. ශ. |
|---|---|---|
| පොළොන්නරුව පාළන දිස්ත්‍රික්කය ... | උම්බලකඩ හෝ බොනිටෝ ෆිෂ් ... | 6 80 |

## දෙවැනි උපලේඛනය

| 1 වැනි තීරය<br>ප්‍රදේශය | 2 වැනි තීරය<br>විස්තර | 3 වැනි තීරය<br>කොළඹ නාගරිකයේ සිල්ලර වෙළෙන්දෙකු විසින් ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් විකුණන මිළට එකතු කළ යුතු වැඩිම මිළ<br>රු. ශ. |
|---|---|---|
| **පොළොන්නරුව පාළන දිස්ත්‍රික්කයට අයත් සිංහළ පත්තුව**<br>අංක 70 ගිරිතලේ ගම්මුළාදැනි කොට්ඨාශයට අයත් සියළුම ගම් :— ගිරිතලේ, ජයන්ති කොළනිය, නුගගහදමන සහ රාජගිරිය යන ගම්.<br>අංක 71 හිඟුරක්ගොඩ ගම්මුළාදැනි කොට්ඨාශයට අයත් සියළුම ගම් :— හිඟුරක්ගොඩ හා උල්පොත්වැව යන ගම්.<br>අංක 71ඒ ගම්මුළාදැනි කොට්ඨාශයට අයත් සියළුම ගම් :—හතමුණ, හිඟුරක්ගල හා කොටුවෙළ යන ගම්.<br>**පොළොන්නරුව පාළන දිස්ත්‍රික්කයව අයත් මැද පත්තුව**<br>අංක 72 ඒ උඩවෙළ (අළුත්වැව) ගම්මුළාදැනි කොට්ඨාශයට අයත් සියළුම ගම් :—අළුත්වැව, පරාක්‍රම සමුද්‍රයෙහි බ්ලොක් " ඒ " ගණන්ගොල්ල, තෝපාවැව වාරිමාර්ග නගරය.<br>අංක 73 තෝපාවැව ගම්මුළාදැනි කොට්ඨාශයට අයත් සියළුම ගම් :— ආණවුළුන්දව, බැදිවැව, පොළොන්නරුව, තෝපාවැව හා තුන්කෙම ගම්.<br>අංක 73 ඒ කුඹුක්කන් ගම්මුළාදැනි කොට්ඨාශයට අයත් සියළුම ගම් :— පැරකුම් උයන, ලක්ෂ උයන, සිංහපුර හා විජයබාහුපුර යන ගම්.<br>අංක 74 මානික්කම්පිටිය ගම්මුළාදැනි කොට්ඨාශයට අයත් සියළුම ගම් :— ගල්ලැල්ල, කොටළිය, මානික්කම්පිටිය හා මාවිළ යන ගම්.<br>අංක 74ඒ කදුරුවෙළ ගම්මුළාදැනි කොට්ඨාශයට අයත් සියළුම ගම් :— කෘෂිකර්ම ගොවිපළ, කදුරුවෙළ, මුස්ළිම් කොළණිය යන ගම්. | උම්බලකඩ හෝ බොනිටෝ ෆිෂ් ... | 0 06 |
| **පොළොන්නරුව පාළන දිස්ත්‍රික්කයට අයත් සිංහළ පත්තුව**<br>අංක 71 මින්නේරිය ගම්මුළාදැනි කොට්ඨාශයට අයත් සියළුම ගම් :— බැද්දේපන්විළ, හල්මිල්ලැව, කටුකෙළියාව, බත්ගම්පත්තුව, මින්නේරිය දුම්රිය නැවතුම්පළ හා රජ ඇළ යන ගම්.<br>අංක 71 සී වෙහෙරගළ ගම්මුළාදැනි කොට්ඨාශයට අයත් සියළුම ගම් :— ගල් අමුණ, කිරිමැටිය, රත්කොත්ගම, සන්සුන්ගම, වෙහෙරළුළිය හා යටියල්පතාන යන ගම්.<br>අංක 71 බී ගම්මුළාදැනි කොට්ඨාශයට අයත් සියළුම ගම් :—කවුඩුල්ල බ්ලොක් "සී" කොටසක්, යටියල්පතාන, පෝද ඇළ බ්ලොක් "ඒ" හා බ්ලොක් "බී" යන ගම්.<br>අංක 71 ඩී උල්කටුපොත ගම්මුළාදැනි කොට්ඨාශයට අයත් සියළුම ගම් :— හිඟුරක්ගොඩ ගොවිපළ හා වින්ඩසර් පාර්ක් යන ගම්.<br>අංක 71 ඇෆ් ගම්මුළාදැනි කොට්ඨාශයට අයත් සියළුම ගම්:— බී. ඕ. පී. 317, ගල් අමුණ හා හිඟුරක්දමන යන ගම්.<br>**පොළොන්නරුව පාළන දිස්ත්‍රික්කයට අයත් මැද පත්තුව**<br>අංක 72 කොටවැල්ල ගම්මුළාදැනි කොට්ඨාශයට අයත් සියළුම ගම් :— අඹන්ගහ, කොටවැල්ල, අංගන්මැඩිල්ල, දස්තොට, දුඹුටුලුවැව, එරමුදුඹය, කළහගල, කකුරුමාන්විළ, නිතුළාවෙළ යන ගම්<br>අංක 73 බී කාළිංග ඇළ ගම්මුළාදැනි කොට්ඨාශයට අයත් සියළුම ගම්:— ගැමුණුපුර, හේවාගම, මොනරතැන්න, පහළගම, වැවේතැන්න යන ගම්.<br>අංක 73 සී පළුගස්දමන ගම්මුළාදැනි කොට්ඨාශයට අයත් සියළු ගම් :— පළුගස්දමන, ගල්තඹරාව, වඩිච්චලේ යන ගම්.<br>අංක 75 පුදූර් ගම්මුළාදැනි කොට්ඨාශයට අයත් සියළුම ගම් :— දිවුළාන, පුදූර්, පුදූර් අටු තෝටම් යන ගම්.<br>**පොළොන්නරුව පාලන දිස්ත්‍රික්කයට අයත් එගොඩ පත්තුව**<br>අංක 84 මනම්පිටිය ගම්මුළාදැනි කොට්ඨාශයට අයත් සියළුම ගම් :— දළුකාන, ගැටමුණ, කොස්ගහ උල්පොත, මහගන්තොට, මනම්පිටිය පුදුකුඩි හා පුදුවේලි යන ගම්.<br>අංක 83 කරපොළ (හැවන්පිටිය) ගම්මුළාදැනි කොට්ඨාශයට අයත් සියළුම ගම් :— බොරවැව, ගිනිදමන, හැවන්පිටිය, කරපොළ කොළකනවේලි, හා වල්ලිද ඌර් යන ගම්. | උම්බලකඩ හෝ බොනිටෝ ෆිෂ් ... | 0 07 |

| 1 වැනි තීරය<br>ප්‍රදේශය | 2 වැනි තීරය<br>විස්තර | 3 වැනි තීරය<br>කොළඹ නාගරිකයේ සිල්ලර වෙළෙන්දෙකු විසින් ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් විකුණන මිළට එකතු කළ යුතු වැඩිම මිළ<br>රු. ශ. |
|---|---|---|
| **පොළොන්නරුව පාළන දිස්ත්‍රික්කයට අයත් සිංහළ පත්තුව**<br>අංක 67 මොරගස්වැව ගම්මුළාදෑනි කොට්ඨාශයට අයත් සියළුම ගම් :— දෙහි අත්තාව, ගල්ලිඳ, හබරණ දුම්රිය නැවතුම් පළ, ඉලුක්වැව, මොරගස් වැව, මොරකන්ද, පොතාන තල්බැද්ද, කිඹිරිගස්වැව හා උණගොල්ලෑව යන ගම්.<br>අංක 68 ගම්මුළාදෑනි කොට්ඨාශයට අයත් සියළුම ගම් :— අළුත්වැව, කිතුලත්තැව, දිවුළන්කඩවල, ගල්ඔය, ගල්ඔය හන්දිය, හතරුස්කොටුව, කිරියගස්කොටුව, මැදිරිගිරිය, පෙතියන්නේඔය, රත්මලේ, රොටවැව, වනිගහේවැව, යටියල්පතාන යන ගම්.<br>අංක 69 කැළෑගම් ගම්මුළාදෑනි කොට්ඨාශයට අයත් සියළුම ගම් :— අළුත්වැව, බෙරිවිළ, කුඹුක්කන්වෙළ, කුරුන්ග වෙට්ටි, මීගස්වැව, මීගොල්ලෑව, පලුක්ගහවැව, කළකොළවැව, වඩිගවැව යන ගම්.<br>අංක 70 ඒ කෝඳුරුවැව ගම්මුළාදෑනි කොට්ඨාශයට අයත් සියළුම ගම් :— අත්තනකඩවල, දියබෙදුම, ඉහකුළුවැව, කටුකෙළියාව කොළණිය, කෝඳුරු වැව යන ගම්.<br>අංක 70 බී කෝට්ටපිටිය ගම්මුළාදෑනි කොට්ඨාශයට අයත් සියළුම ගම් :— අත්තරගල්ලෑව, බකමූණ, ඇළහැර හා හිරටිය යන ගම්.<br>**පොළොන්නරුව පාළන දිස්ත්‍රික්කයට අයත් මැද පත්තුව**<br>අංක 75 ඒ ඔනෑගම ගම්මුළාදෑනි කොට්ඨාශයට අයත් සියළුම ගම් :— ඔනෑගම හා පුදූර් කොළණිය යන ගම්.<br>අංක 76 තල්පොත ගම්මුළාදෑනි කොට්ඨාශයට අයත් සියළුම ගම් :— හේවාතැන්න, සේනානායකපුර, වීරපුර හා විජයපුර යන ගම්.<br>අංක 77 තඹාල ගම්මුළාදෑනි කොට්ඨාශයට අයත් සියළුම ගම් :— බී. ඕ. පී. 314 නැගෙනහිර, ගල්කැටියදමන, ඔනෑගම සින්නගහ, සින්නවිල්ලුපිටිය, තඹාල, උරනෙයි යන ගම්.<br>අංක 78 සුංගාවිළ ගම්මුළාදෑනි කොට්ඨාශයට අයත් සියළුම ගම් :— කිරි-මැටියදමන, කුමාඩිය, මීන්විල්ලු, සෝමාවතිය, සුංගාවිළ, සුංගාවිළ පුදූර් යන ගම්.<br>අංක 78 ඒ කුමාඩිය ගම්මුළාදෑනි කොට්ඨාශයට අයත් සියළුම ගම් :— අභය පුර, කැගලුගම, සූළස්තිගම යන ගම්.<br>අංක 79 පල්ලිය ගොඩැල්ල, ගම්මුළාදෑනි කොට්ඨාශයට අයත් සියළුම ගම් : අඩන්පත් ආරු, බොරුපන්විල, අළිකෙළි අඩි තෙත්ති, කුරුංචි මුනෙයි, පල්ලිය ගොඩැල්ල, පඟුරණ, පුදුවෙලි යන ගම්.<br>**පොළොන්නරුව පාලන දිස්ත්‍රික්කයට අයත් එගොඩ පත්තුව**<br>අංක 80 කාන්ඩකාඩු ගම්මුළාදෑනි කොට්ඨාශයට අයත් සියළුම ගම් :— අන්ගොඩ, ඉළන්දමොදෙයි, කෝසාකුළම, කුරුබච්මුනෙයි, මාවිළ, පම්බුකුල්මුනෙයි, රොටවැව, රෙට්ටිවාකුළම, තැන්නතෝට්ටම් හා තිරිකුණාමඩු යන ගම්.<br>අංක 81 මුතුගල ගම්මුළාදෑනි කොට්ඨාශයට අයත් සියළුම ගම් :—නෙල්-වැල්ලිනාකුළම, පච්චකාඩුචේන, තිරියමුනෙයිවිල්, කටුවන්විළ, මුතුගළ, වට්ටවචේන යන ගම්.<br>අංක 82 මාකුප්පේ ගම්මුළාදෑනි කොට්ඨාශයට අයත් සියළුම ගම් :— අන්ගිරි-යදමන, බෙල්ලන්නේවෙළ, කඩවත්මඩු, කල්මඩු, කුමාරපුරගම, කුරුංචි-දමන, මාකුප්ප, පුල්ලෙයාර් අඩි, සූරියෝදෙයි, වැළිකන්ද යන ගම්.<br>අංක 85 අළවාකුඹුර ගම්මුළාදෑනි කොට්ඨාශයට අයත් සියළුම ගම් :— අළවාකුඹුර, බැන්ඩියවිළ, දමනේ උල්පොත, අරළගන්විළ, ගල්කුළම, සොරිවිළ, කන්දේගම, කුඩා උල්පොත, මල්ලිය තිව්, උල්පොතවැව, වෙහෙරගොඩ හා විළයාය යන ගම්.<br>අංක 85 ඒ යක්කුරේ ගම්මුළාදෑනි කොට්ඨාශයට අයත් සියළුම ගම් :— යක්කුරේ හා කැකුළුබෙ යන ගම්. | උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් ... | 0 08 |

**සැළකිය යුතුයි.**—ඉහත සඳහන් මිළ ගණන් ඒ ඒ ද්‍රව්‍යයන් විකිණිය යුතු නියමිත මිළ නොවේ. මෙ මිළ ගණන් ඒ ඒ ද්‍රව්‍යයන් විකිණිය හැකි ඉතාම වැඩි මිළ ගණන්ය. ඒ මිළ ගණන්වලට ඉහළින් ඒ ද්‍රව්‍යයන් විකිණිය නොහැකියි.

12–140

ලඞකාවේ වාලච්චේනයෙහි පිහිටි " ඊස්ටන් පේපර් මිල්ස් කෝපරේෂන් " හි නිපදවන ලද කඩදාසිවල ලංකාණ්ඩුවේ මුද්‍රණාලයයේ මුද්‍රාපිතයි.